# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14**

**2017 අප්‍රේල් - ජූනි**

**මානවශාස්ත්‍ර පීඨය**

**ප්‍රාසංගික කලා - PART – E 2015**

**ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය නර්තන සම්ප්‍රදා**

**(පැරණි නිර්දේශය)**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 16 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ශ්‍රී ලංකාවේ නර්තන සම්ප්‍රදා වෙතින් ප්‍රකටවන සම්භාව්‍ය ලක්ෂණ 05 ක් ඔබ කැමති එක් නර්තන සම්ප්‍රදායක් ඇසුරින් පැහැදිලි කරන්න.

02. කොහොඹායක් කංකාරියට අයත් අස්නෙ නැටුමෙහි නාට්‍යමය ලක්ෂණ අගැයීමට ලක් කරන්න.

03. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් නානුමුරයෙහි විචිත්‍රත්වය කෙරෙහි එකී නර්තනයට අයත් කවි ගායනා ඉවහල් වී ඇති අයුරු පැහැදිලි කරන්න.

04. සබරගමු වන්නම් උඩරට හා පහතරට වන්නම්වලින් වෙනස් වන්නේ කවර හේතු නිසා දැයි පැහැදිලි කරන්න.

05. මහනුවර දළදා මාළිගයට අයත් ඇසළ පෙරහැර නර්තන උඩරට නර්තන සම්ප්‍රදාය කෙරෙහි දක්වන දායකත්වය පැහැදිලි කරන්න.

06. පහතරට නර්තනයෙහි විචිත්‍රත්වය කෙරෙහි වෙස් මුහුණුවලින් ලැබී ඇති දායකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

07. පහත සඳහන් නර්තන අතුරින් **දෙකක** ශාස්ත්‍රීය ලක්ෂණ පැහැදිලි කරන්න.

    අ) පත්තිනි නැටුම - පහතරට නර්තන සම්ප්‍රදාය

    ආ) මුළලඩි වන්නම - උඩරට නර්තන සම්ප්‍රදාය

    ඇ) දලුමුර පදය - සබරගමු නර්තන සම්ප්‍රදාය

    ඉ) ශුද්ධ මාත්‍රය - පහතරට නර්තන සම්ප්‍රදාය

08. දේශීය සංගීතය කෙරෙහි නාඩගම් සංගීතය විසින් ඇති කරන ලද බලපෑම විමසීමට ලක් කරන්න.

09. නුර්ති සංගීතය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම කෙරෙහි නීතිඥ ජෝන් ද සිල්වාගේ දායකත්වය අගයන්න.

10. කතෝලික ආගමික අදහස් ප්‍රචලිත කිරීම කෙරෙහි කැරොල්, පසන් සහ කන්තාරු ගායනා කොතෙක් දුරට ඉවහල් වී දැයි පැහැදිලි කරන්න.

11. ශ්‍රී ලංකාවේ සරල සංගීත නිර්මාණ කෙරෙහි ග්‍රැමෆෝන් සංගීතය විසින් හඳුන්වා දෙන ලද ලක්ෂණ කවරේදැයි විමසන්න.

12. 80 දශකයට අයත් කණ්ඩායම් සංගීතය ශ්‍රී ලංකාවේ සමකාලීන සංගීතය කෙරෙහි ඇති කරන ලද බලපෑම පැහැදිලි කරන්න.

13. වර්තමාන සංගීත නිර්මාණ කෙරෙහි පරිගණකගත සංගීතය යොදා ගැනීමෙහි ඖචිත්‍යය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

14. උඩරට වන්නම් ශාස්ත්‍රීය නර්තන විශේෂයක් මෙන්ම ගායන විශේෂයක් ලෙසද සැලකීමට ඉවහල් වී ඇති කරුණු සාකච්ඡා කරන්න.

15. දේශීය ජන ගී සමකාලීන ප්‍රාසංගික වේදිකාවෙහි ජනප්‍රිය මූලයක් බවට පත් කිරීම සඳහා පුරෝගාමී වූ ශිල්පීන් දෙදෙනෙකුගේ මෙහෙවර ඇගැයීමට ලක් කරන්න.

16. ඔබ කැමති ජන ගායනා දෙකක් තෝරාගෙන එමගින් විද්‍යාමාන වන සමාජ, සංස්කෘතික ලක්ෂණ පැහැදිලි කරන්න.

**********************